**මස්කෙළිය ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේවිධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වයපළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනයකළමතය සඳහාපදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාමූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළමතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනයකරනපාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවියහැකි අතර ,එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍යප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳාපවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍යප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුවප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ සම්පිණ්ඩන වාර්තාවේ 1.2.2 ඡේදයේ (අ)හා (ඇ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ ආදායම රු.805,711 ක් හා මුද්දර ගාස්තු ආදායම රු.2,240,030 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති ජල ටැංකි 13 ක්, රූපවාහිනී යන්ත්‍ර 01 ක්, පුස්තකාල පොත් 12 ක් සහ කසළ | පිරිවැය හඳුනා ගැනීමට කටයුතු සිදු කරන අතර එම භාණ්ඩ ස්ථාවර | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | |
|---|---|
| එකතු කිරීමේ මධ්‍යස්ථානයේ උපකරණ 10 ක පිරිවැය හඳුනාගෙන ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම්ලේඛනයේ ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. |

1.7 අනුකූල නොවීම්
------------------

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්
---------------------------------------------------------------------------

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පනත්<br>------<br>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 47 (2) (1) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි සැලසුම්අනුමත කිරීමට පෙර ඉදිකිරීම් අවසන් කර තිබුණු ගොඩනැගිලි 03ක් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයදුම්කරුවන් විසින් එම ඉදිකිරීම් නවත්වා ඉදිකිරීම් නියමානුකූල කර ගැනීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය<br>---------------------------- | | | |
| i. | 2016මාර්තු 17දිනැති අංක 3/2016 | (අ) කඩ කාමර 8ක එක්වන් මුදල එකවර ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් වලංගු බදු ගිවිසුම් අත්සන් කර නොතිබිණි. | ඉදිරියේදී බදු ගිවිසුම් අත්සන් කර ගැනීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | (ආ) කඩ කාමර කුලිය වසර 05 කට වරක්වත් සංශෝධනය කළ යුතු වුවද, එසේ කටයුතු නොකර සභාව විසින් 2009 වර්ෂයේ තක්සේරු කළ කඩ කුලී අයකරමින් පැවතුණි. | ඉදිරියේදී තක්සේරු කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| ii. | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරණ චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපල වසර 05 කට වරක්වත් තක්සේරුව සිදුකළ යුතු වුවද, 2010 වර්ෂයට පසුව එසේ වරිපනම් බදු දේපල තක්සේරු කර නොතිබුණි. | වරිපනම් තක්සේරුව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් මේ වන විට සිදු කරමින් පවතින බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

1.8 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු
---------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 108 වගන්තියට අනුව මහජනයා ගැවසෙන පොදු භූමියක පොදු පහසුකම් සැලසීමේ වගකීම ප්‍රාදේශීය සභාවට පැවරී තිබුණද, ප්‍රාදේශීය සභාවේ අනුමැතියකින් තොරව ශ්‍රී පාද වන්දනා සමයට පැමිණෙන බැතිමතුන් සඳහා නාන පිහිලි ඉදිකර ඒ ආශ්‍රිතව පුද්ගලික සමාගමක සන්නම් නාම ප්‍රදර්ශනය කර බාහිර පාර්ශවයින් විසින් ආදායම් රැස් කිරීමට කටයුතු කර තිබුණි. | ගාස්තු අය කිරීම සඳහා මේ වන විට අදාළ පාර්ශව දැනුවත් කර ඇති බව. | පොදු පහසුකම් සැලසීම සභාව මඟින් සිදුකර සහා ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය
------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,974,851 ක් වූ අතර ඊට අනුරූපීවඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.505,237 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | 2023 බිල්කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,513,141 | 3,202,897 | 3,277,795 | 1,283,150 | 4,129,674 | 3,431,933 | 4,302,044 | 1,358,047 |
| (ii) | කඩ කුලී | 9,139,000 | 10,022,200 | 7,547,849 | 6,408,335 | 8,232,900 | 5,148,100 | 3,727,413 | 3,933,984 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,261,000 | 1,719,098 | 1,719,098 | - | 1,511,000 | 1,391,422 | 1,391,422 | - |
| (iv) | වෙනත් ආදායම් | 70,172,362 | 22,890,490 | 6,145,391 | 19,509,591 | 63,050,973 | 2,376,301 | 1,692,400 | 2,764,492 |
| | | 85,085,503 | 37,834,685 | 18,690,133 | 27,201,076 | 76,924,547 | 12,347,756 | 11,113,279 | 8,056,523 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් බදු** | | |
| එකතුව රු. 1,762,927ක හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති අනුව කටයුතු කර අයකර නොතිබුණි. අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් පවරාදෙන ලද 2018 ට පෙර සිට අයවිය යුතු රු.561,558ක වරිපනම් බදු ඒකක 74 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා දේපළ තහනම් කිරීමේ වැඩසටහනක් සංවිධානය කර ඇති බව. | හිඟ ආදායම් අය කළ යුතුය. |
| **(ආ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ කඩ කාමර 19 ක් සඳහා රු.719,000 ක බිල් කිරීම් පැවතියද, එයින් අයවී තිබුණේ රු.215,550 ක් හෙවත් සියයට 30 ක් පමණි. 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලයට අදාළ කඩ කුලී හිඟයරු. 1,168,235 ක් විය. | ගිවිසුම් කාලය අවසානයේ නැවත කඩ කාමර පවරා ගැනීමේදී ආදාළ හිඟ මුදල් තැන්පත් මුදලින් අය කර ගැනීමට හැකි බව | හිඟ ආදායම් අය කළ යුතුය. |

(ඇ) වෙනත් ආදායම්

--------------------

| | | |
|---|---|---|
| නියැදි භෞතික පරීක්ෂාවට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට නල්ලතන්නිය ප්‍රදේශයේ දැන්වීම් පුවරු 24 කින් රු.60,900 ක් අයකර ගෙන නොතිබුණි. | මුදල් අය කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | ආදායම් අයකිරීමට කටයුතු කළ යුතුය. |

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 661,121 ක් හා මුද්දර ගාස්තු රු.18,848,470 ක් විය. | අදාළ උසාවි දඩ හා මුද්දරගාස්තු ලබා ගැනීමට උපලේඛන ඉදිරිපත් කර ඇති බව | ආදායම් අය කර ගත යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම.

-----------------------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 96 වගන්තිය ප්‍රකාරව සභාවට අයත් අප්කට් ජල යෝජනා ක්‍රමයේ SLS 614. 2013 අනුව පැවතිය යුතු බැක්ටීරියා සම්මත අගය ඉක්මවා තිබියදී පිරිපහදු කිරීමකින් තොරව ජල පාරිභෝගිකයන් 76 දෙනෙකුට පානීය ජලය බෙදාහැර තිබුණි. | මේ වන විට ප්‍රතිපාදන වෙන්වී ඇති බැවින් පිරිපහදු ටැංකියක් සකස් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර යොමු කර ඇති බව. | පිරිසිදු පානීය ජලය ලබාදිය යුතුය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව පරිහරණය කරන රිකාටන් කසළ අංගනය පිහිටි ඉඩම හා තවත් ඉඩම් 35 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් වෙත මේ සම්බන්ධයෙන් ලිපි යොමු කර ඇති බව. | දේපල පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජුනි 13 දිනැති තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාව අනුව කඩ කුලී අය නොකර පැරණි කඩකුලී අය කිරීම හේතුවෙන් කඩ කාමර 12 ක මාස 06 ක කාලයක් සඳහා රු.220,200 ක ආදායම් අහිමි වී තිබුණි. | ඉදිරියේදී තක්සේරු කුලිය අයකරන බව | තක්සේරු කර කුලී අයකළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් කැබ් රථයක් හා ට්‍රැක්ටර් රථයක් 2018 සිට අවුරුදු 5 කට ආසන්න කාලයක් මස්කෙළිය ප්‍රදේශයේ ගරාජයක් තුළ අළුත්වැඩියා නොකර නිෂ්කාර්යයව ගාල් කර තිබුණු අතර කැබ් රථයේ ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් එන්ජින් අංකය හා භෞතිකව පවතින එන්ජිමේ අංකය පරස්පර විය. | එන්ජින් අංකය පොතේ සඳහන් අංකය හා පවතින එන්ජිමේ අංකය අතර වෙනසක් පිළිබඳව ලබා දෙන ලද ලිපි ලේඛන වල සඳහන් කර නොමැති බව. | එංජින් අංකයේ වෙනසට හේතු පරීක්ෂා කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති වටිනාකම හඳුනාගෙන නොමැති යන්ත්‍ර උපකරණ හා ලී බඩු හා කාර්යාල උපකරණ 40 ක් 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ ජනවාරි 31 දින දක්වා කාල පරාසයක සිට නිශ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවතුණි. | පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින් එම භාණ්ඩ අවශ්‍ය වේලාවන්හිදී ලබා ගැනීම සඳහා ගබඩා කර ඇති බව. | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | 2020 වර්ෂයේ රු.583,429 ක් වැය කර ඉදිකර තිබුණු තාවකාලික කඩ කාමර 03 ක් වසා දමා තිබුණි. | සභාවේ ගබඩාව ලෙස භාවිතා කිරීමට කටයුතු කර ඇති බව | කඩ අරමුණ ගත කාර්යයට යොදවා ගත යුතුය. |
| (ඈ) | නල්ලතන්නිය පුදබිම ආශ්‍රිතව පෞද්ගලික ඉඩම් හිමිකරුවකු විසින් හා ආගමික ස්ථානයක් විසින් අනවසරයෙන් පස් කපා දමා ගොඩනැගිලි හා තාප්ප ඉදිකර පස් හා ගල් අසල ජල මාර්ගයට බැහැර කර පරිසර | මෙම ඉදිකිරීම් අත්හිටුවන ලෙස දන්වා ලිපි නිකුත් කර ඇති බව . | අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

හානියක් සිදුකර තිබුණි. එසේම තවත් ස්ථානයක අනවසරයෙන් කැලෑ ප්‍රදේශ එළිකර බ්ලෝක් ගල් මඟින් කබානා ඉදිකරමින් පැවතුණි.

3.4 මානව සම්පත් කළමනාකරණය
--------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 17 ක පුරප්පාඩු 69 ක් පැවතුණි. | මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් තනතුරු අනුමත කළ යුතු බැවින් මෙතෙක් පුරප්පාඩු පිරවී නොමැති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය. |